# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව

செயலகம், கொழும்பு 01.
இலங்கை

The Secretariat, Colombo 01.
Sri Lanka

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324

ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance: (+94)-11-2449823
ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media: (+94)-11-2513458

වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PFD/RED/CIR/2018/02
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2018.08. 18

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක :- 02/2018

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන ප්‍රධානීන්,

**<u>ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සමාලෝචනය - 2016 අයවැය යෝජනා</u>**

රජය යටතේ පවත්වාගෙන යනු ලබන සියළුම අරමුදල්වල පැවැත්ම සාධාරණීකරනය පිණිස හා ඒ අනුව එම අරමුදල් පාර්ලිමේන්තුවේ පිළිගත් ක්‍රියාදාමයකට අනුකූලව පාර්ලිමේන්තු මූල්‍ය පාලනයට යටත් කිරීම අරමුණු කරගෙන ඉදිරිපත් කළ 2016 අයවැය යෝජනා අංක 425 සහ 426 අනුව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් රාජ්‍ය ආයතන විසින් පවත්වාගෙන යන ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය සාධාරණීකරණය කිරීම මෙන්ම මෙම අරමුදල් ස්ථාපිත කර ඇති අරමුණු, විෂය පථයන් සහ නීතිමය තත්ත්වයන් පරික්ෂා කර සිදු කළ යුතු වෙනස්කම් වේ නම් ඒ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මා විසින් පත් කරන ලදී.

2. යථෝක්ත කමිටුව මගින් ලබාදී ඇති නිර්දේශ සහිත වාර්තාව 2017.06.21 දින ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභාව වෙත යොමු කරන ලද අතර, 2017 ජුලි මස 19 වන දින පැවති ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභාවේ නිර්දේශ අනුව අමප 17/1615/702/002 – xvii හා 2017 අගෝස්තු මස 09 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇත.

I. සමාලෝචනයට භාජනය කරන ලද අරමුදල් 210 අතුරින් අරමුදල් 105 ක් මහජන අරමුදල් ලෙස හඳුනාගෙන ඇති අතර, ඉන් අරමුදල් 10 ක් මහජනයාගේ මතය දෙස බලන කල විශාල ලෙස බලපෑම් ඇති කරනු ලබන අරමුදල් 10 ක් වන බැවින්, ඒ සම්බන්ධ තවදුරටත් අධ්‍යයනය කර අවශ්‍ය පියවර ගැනීම.

II. අරමුදල් තුලින් උපයනු ලබන ආදායම් උපයෝගී කර ගනිමින්, අරමුදල් 21 ක් වර්තමානයේ පවතින ආකාරයටම තව දුරටත් පවත්වාගෙන යාම.

III. වසා දැමීමට හැකියාවක් ඇති බවට හඳුනාගෙන ඇති පවත්නා අරමුදල් වසා දැමීමට පියවර ගැනීම.

IV. අනෙකුත් සියළුම අරමුදල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 හා 149 වගන්ති ප්‍රකාරව පාර්ලිමේන්තු මූල්‍යය පාලනය යටතට පත්කිරීම.

3. එකී නිර්දේශ ඇතුළත් චක්‍රලේඛයක් මහා භාණ්ඩාගාරය මඟින් නිකුත් කළ යුතු බවට පෙන්වා දී ඇති අතර ඒ අනුව, පවත්නා පහත සඳහන් අරමුදල් 13 වසා දැමීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒවා නම්,

| | අරමුදලේ නම | අරමුදල අයත් රාජ්‍ය ආයතනය |
|---|---|---|
| 1 | ජාතික උද්භිද උද්‍යානභාර අරමුදල | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව |
| 2 | අධිකරණ යටිතල පහසුකම් නඩත්තුභාර අරමුදල | අධිකරණ සේවා කොමිසම |
| 3 | මාර්ග නඩත්තු භාරකාර අරමුදල | මහා මාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය |
| 4 | ජාතික ළමා සංවර්ධන අරමුදල | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය |
| 5 | වන සත්ත්ව භාර අරමුදල | තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය |
| 6 | වාහන වායු විමෝචන භාරකාර අරමුදල | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව |
| 7 | සිසු අරුණ ශිෂ්‍යත්ව අරමුදල | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 8 | මහින්දෝදය ශිෂ්‍යත්ව අරමුදල | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 9 | සුජාත දියණි අරමුදල | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 10 | නාවික සංවර්ධන අරමුදල | වරාය, නැව්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය |
| 11 | රාජ්‍ය ආයතනයන්හි තාවකාලික අතිරික්ත භාර අරමුදල | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය |
| 12 | වැවිලි ස්වයං රැකියා චක්‍රීය අරමුදල | කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය |
| 13 | විශේෂ ආර්ථික මධ්‍යස්ථාන නඩත්තු අරමුදල | ධීවර,ජලජ සම්පත් හා ග්‍රාමීය කටයුතු පිළිබඳ අමාත්‍යාංශය |

4. ඒ අනුව, යථෝක්ත අරමුදල් සඳහා බලපානු ලබන නීතිරීති අණපනත් සහ ඊට අදාල භාර ඔප්පුවල සඳහන් වූ ආකාරයට අරමුදලේ පවත්නා වත්කම් තුළින් වගකීම් නිරවුල් කර ඉතිරි වූ මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට පියවර ගත යුතුය. මේ සඳහා ඈවරකරුවෙකු (liquidator) පත්කර අදාල කාර්යයන් කඩිනමින් සිදු කර අරමුදල වසා දැමිය යුතුය.

5. තවද, පසුගිය වසර දෙක තුල දී ක්‍රියාත්මක නොවුනු යම් අරමුදල් පවතින්නේ නම් එකී අරමුදල් වල කටයුතු යථෝක්ත 04 ඡේදයේ පරිදි අවසන් කර, එම අරමුදල් වල ඉතිරි වූ මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට පියවර ගතයුතුය. ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අරමුණුවලට අනුකූලව ව්‍යවස්ථාමය රාමුවෙන් පිටත අරමුදලක් නොපවතිනු ඇත. එම අරමුදල් මඟින් කරගෙන යනු ලබන කාර්යයන් තව දුරටත් කර ගෙනයාම අවශ්‍යවේ නම් ඒ සඳහා වෙනම අයවැය ප්‍රතිපාදන වෙන් කරවාගෙන එකී කාර්යයන් ජාතික අයවැය තුල තවදුරටත් ඉදිරියට කරගෙන යාමට හැකිය.

6. එබැවින්, අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඔබ අමාත්‍යාංශයට අදාල අරමුදල් වේ නම්, මෙම චක්‍රලේඛයේ 2 වගන්තිය යටතේ දක්වා ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කඩිනම් පියවර ගන්නා ලෙස ඔබට දන්වන අතර, තවදුරටත් ඒ සම්බන්ධව පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් "අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව" (අංක 011- 2484614) අමතන ලෙස ද, ඔබ විසින් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව 2018.09.14 දිනට පෙර මා වෙත දන්වන්නේ නම් මැනවි.

මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමේදී මතුවිය හැකි යම් ගැටළු වේ නම්, ඒවා නිරාකරණය කිරීම සඳහා ඉදිරියේදී අදාල දැනුවත් කිරීම් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදුකරනු ඇත.

ආර්.එච්.එස්. සමරතුංග
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත් :-

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති